- ප්‍රකාශනය -
ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස
කොළඹ - 07

© ජාතික විද්‍යා පදනම 2015

මෙම ග්‍රන්ථයේ කතුවරයා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රකාශ හා අදහස් පිළිබඳව ජාතික විද්‍යා පදනම කිසිදු වගකීමක් නොදරයි.

බාහිර හා ගෘහස්ථ වාතයේ ගුණාත්මක බව - මහාචාර්ය කේ. ආර්. රංජිත් මහානාම
පළමු මුද්‍රණය - 2015 ජනවාරි

ISBN: 978-955-590-118-5

ප්‍රකාශන සම්බන්ධීකරණය - පිත්‍යා විජේසිංහ - විද්‍යාත්මක නිලධාරිනී
ජාතික විද්‍යා පදනම

චිත්‍ර සහ පිටු සැලසුම් - අනුර ශ්‍රීනාත් ක්‍රියේෂන්ස්

මුද්‍රණය - මුද්‍රණ ඒකකය,
ජාතික විද්‍යා පදනම,
47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ - 07.

# සභාපතිතුමාගේ පණිවිඩය

අපට අවශ්‍යව ඇත්තේ කිසිදා නොතිබූ දේ පිළිබඳව සිහින දැකීමට සමත් ජනතාවකි" යයි ලෝකයේ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ අග්‍රස්ථානයේ වැජඹෙන ඇමෙරිකා එක්සත් ජනපදයේ විසූ ශ්‍රේෂ්ඨතම ජනාධිපතිවරයකු වූ ජෝන් එෆ්. කෙනඩි මහතා පවසා ඇත.

ආශ්චර්යයෙන් පිරි සමෘද්ධිමත් හා සංවර්ධිත ජාතියක් ලෙස අනෙකුත් රටවල් සමඟ ලෝක තලයේ එකම වේදිකාවක රැඳීමට නම් අප රටටද අවශ්‍යවන්නේ එවැනි ජනතාවකි. විද්‍යාත්මක දැනුම, තාක්ෂණ හැකියාව සහ නවෝත්පාදන උත්තේජනය සහිත ශිෂ්‍ය පරපුරක් වර්ධනය කර ගැනීමේ අවශ්‍යතාවය මතුවන්නේද රට පෙරට ගෙන යන සිහින පෙනෙනුයේද ඔවුනටම බැවිනි.

උසස් අධ්‍යාපනය සඳහා විද්‍යා හා තාක්ෂණ විෂයධාරා තෝරාගත්තද නොගත්තද සෑම ශිෂ්‍යයෙකු හා ශිෂ්‍යාවක තුළම විද්‍යාත්මක දැනුම, චින්තනය සහ ආකල්ප පැවතිය යුතුවන්නේ ඔවුන්ගේ මනස තුළ නිති කුළු ගැන්වෙන කුතුහලය සංසිඳවාලමින් රටට වැඩදායී පුරවැසියකු කිරීමට ඒ අත්‍යාවශ්‍ය වන බැවිනි. එහෙයින් පාසල් පත පොතට අමතරව අප ශිෂ්‍ය ශිෂ්‍යාවන් විද්‍යාව දෙසට නැඹුරු කරවන අතිරේක පත පොත පළව තිබීමේ අවශ්‍යතාවය වටහාගත් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සහ ජාතික විද්‍යා පදනම පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉලක්ක කර ගත් මෙම පසුබිම් පොත් පෙළ සංවර්ධනය කිරීමට පියවර ගනු ලැබිණ.

විද්‍යා ක්ෂේත්‍රයේ පළපුරුදු විද්වතුන් රැසක සහභාගිත්වයෙන් යුතුව විවිධ විද්‍යා විෂය ඔස්සේ සරල බසින් හා විචිත්‍රාකාරයෙන් සංවර්ධනය කළ මෙම පොත් පෙළ මෙරට සිංහල - දෙමළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විද්‍යා පිපාසාව නිවීම උදෙසා මහඟු සේවාවක් ඉටුකරනු ඇතැයි යන්න අපගේ අපේක්ෂාවය.

මෙම පොත්පෙළ සංවර්ධනයේදී නොයෙකුත් ආකාරයෙන් දායක වෙමින් සහාය දැක්වූ සැමට ජාතික විද්‍යා පදනමේ කෘතඥතාවය පිරිනැමීමටද කැමැත්තෙමි.

මහාචාර්ය ඩබ්ලිව්. එල්. සුමතිපාල
සභාපති
ජාතික විද්‍යා පදනම

# හැඳින්වීම

මෙම පොත් පිංචෙහි ප්‍රධාන අරමුණ බාහිර සහ ගෘහස්ථ වාතයේ ගුණාත්මකභාවය පිළිබඳ අවබෝධයක් ඔබට ලබාදීමය. වායුගෝලය සහ එහි සංයුතිය, වායුගෝලයේ සංයුතිය වෙනස්වීමට බලපාන ස්වභාවික ක්‍රියාවලි සහ මානව ක්‍රියාකාරකම් පිළිබඳවත් එමඟින් මිනිසාට සහ පරිසර පද්ධතියට සිදුවන බලපෑම මෙන්ම වාතයේ ගුණාත්මක බව ඉහළ දැමීම සඳහා ඔබ සතු කාර්යභාරය පිළිබඳ කෙටි විස්තරයක් මෙහි අඩංගු වේ. මෙය 9, 10, 11 වසරවල සිසුන් සඳහා වඩා යෝග්‍ය වේ යයි සිතමි.

මහාචාර්ය කේ. ආර්. රංජිත් මහානාම
කොළඹ විශ්ව විද්‍යාලය